සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා

ර/නිවි/රඹුක මහා විද්‍යාලය, කලවාන.

නිපුණතා මට්ටම : පරිසරයේ දක්නට ලැබෙන මිනිස් චරිත ඇසුරෙන් නර්තන නිර්මාණ කරයි.
ක්‍රියාකාරකම : "නර්තන මාධ්‍යයෙන් මිනිස් චරිත නිරූපණය කරමු".

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ 8 ශ්‍රේණියේදී සත්ව චරිත නර්තනය ඇසුරින් ඉදිරිපත්කළ අයුරු සිහියට නගා ගන්න.

දෙවන පියවර : දැන් ඔබ දැක ඇති මිනිස් චරිත 5ක් ඔබට නම්කල හැකිදැයි බලන්න. උදා:- මහල්ලා, ධීවරයා, ගොවියා, කම්මල්කරු, උන්මන්තකයා, කරත්තකරු.

තුන්වන පියවර : ඒ චරිතවලට ඇති සුවිශේෂී ලක්‍ෂණ කිහිපයක් පිළිවෙලකට ලිවීමට හැකිදැයි බලන්න.
උදා:- ධීවරයා,

- ඔරුව දියත් කිරීම
- ඔරුව පැදීම
- දැල දැමීම
- දැල ඇදීම
- මාළු තෝරා දැමීම
- ඔරුව ගොඩට පැදීම

හතරවන පියවර : ඔබ ගොණුකළ චරිත ලක්ෂණ ඉදිරිපත් කිරීමට උත්සාහ කරන්න. ඒ සඳහා නර්තනය ට යොදාගන්නා චලනද එක් කරන්න. පසුගිය ශ්‍රේණිවලදී ඉගෙනගත් දේ ඒ සඳහා යොදා ගන්න.

පස්වන පියවර : ඔබ විසින් චරිතයකට අදාලව,

- සුවිශේෂී ලක්ෂණ කිහිපයක් ලියන්න
- එක් චරිතයක් තොරාගනිමින් ඒ හා සම්බන්ධ කථාවක්/සිද්ධියක් ගොඩනගන්න.
- එම සිද්ධිය නර්තනය එක් කරගනිමින් ඉදිරිපත් කිරීමට උත්සාහ කරන්න.
- ඒ සඳහා තාලානුකුල, රිද්මයානුකූල හා ප්‍රකාශනාත්මක චලන භාවිතා කරන්න.
- චරිත හා සිද්ධි ඉදිරිපත් කිරීමේ දී ඔවුන් භාවිතාකරන උපකරන පිලිබඳවද සැලිකිලිමත් වන්න.

දැන් ඔබ,

1- නර්තන මගින් ඉදිරිපත් කළහැකි චරිත පහක් නම්කරන්න.

2- එම චරිත පහේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්‍ෂණ පහ බැගින් ලියන්න.

3- එයින් චරිත කිහිපයක් හෝ නර්තනයෙන් ඉදිරිපත් කිරිමට සුදුසු සිද්ධියක්/කථාවක් ගොඩනගන්න./ලියන්න.

4-විවිධ චලන, ඉරියව්, යොදාගනිමින් නර්තනයෙන් එම චරිත ඉදිරිපත් කිරීමට උත්සාහ කරන්න.

5- පාසැලේ ගුරුවරයා හමු වූ පසු තම නිර්මාණය ඉදිරිපත්කර අඩුපාඩු සකසාගන්න.

තව දුරටත් අධ්‍යයන කාර්යයේ නිරතවීම සඳහා සබරගමු පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ e - නැණ පියසට පිවිස 9 ශ්‍රේණියේ නර්තනය විෂයට අදාල ස්ථානයට පිවිසෙන්න. www.enenapiyasa.lk

www.enenapiyasa.lk → Home page (සිංහල තෝරාගන්න) → 9 ශ්‍රේණිය (තෝරාගන්න) → 9 ශ්‍රේණිය නර්තනය (තෝරාගන්න) → නර්තනය පාඩම් (අදාල පාඩම තෝරාගන්න)

***